# ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම

කේ. පී. එල්. මධුභාෂිණී[1]


**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ තේ වල රසය හා සුවඳ සඳහා ලෝකයේ දක්නට ලැබෙන්නේ ඉතා ඉහළ පිළිගැනීමකි. ශතවර්ෂයකට අධික කාලයක සිට තේ කර්මාන්තය රැකියා, අපනයන ආදායම, රජයේ ආදායම් සම්බන්ධයෙන් විශාලතම සැපයුම්කරු බවට පත්ව තිබේ. කෙසේ වෙතත් කෙන්යාව වැනි නැගී එන නිෂ්පාදකයන් නිසා වෙනත් රටවලට සිය තත්වය පවත්වා ගැනීමේදී දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වී තිබේ. මෙම අධ්‍යයනය තුළින් තේ වගාවේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ තේ අපනයනය, ශ්‍රී ලංකාවේ තේ මිල හා ද්විතික දත්ත භාවිතයෙන් ඒවායේ වෙනස් වීම් සම්බන්ධව විශ්ලේෂණයක් ද සිදු කොට තිබේ. තවද දත්ත විශ්ලෙෂණය මගින් පැහැදිලි වන්නේ තේ කිලෝවක් සඳහා ගොවියෙක් සඳහා ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් තේ කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන බවයි. එමෙන්ම තේ නිෂ්පාදනය සඳහා ගෙවන මිල විශාල ලෙස වැඩි වීමක් පෙන්නුම් කළ ද එයට සාපේක්ෂව තේ නිෂ්පාදනය එතරම් වර්ධනයක් පෙන්නුම් නොකරයි.


***මුඛ්‍ය පද:*** *තේ නිෂ්පාදනය, අපනයනය, මිල*

**හැඳින්වීම**

තේ ගසෙහි උද්භිත විද්‍යාත්මක නාමය කැමිලියා සිනෙන්සිස් වේ. මෙම ශාකය 3m ට වඩා උසට වැඩෙයි. සුදු පැහැති කුඩා මල් හටගන්නා අතර තේ ඇට කොල පැහැයකින් යුක්ත වේ. තේ වගාවේදී මෙම ගස වඩා උස් වීමට ඉඩ නොතබන අතර එය කප්පපාදු කිරීමකට ලක් කරනු ලැබේ. කප්පාදු කිරීම කරනු ලැබෙන්නේ වඩාත් දළු ලබා ගැනීමේ පරමාර්ථයෙනි. තේ පඳුරක් වර්ධනය වීම පිණිස 1250mm අවම වර්ෂාපතනයක් අවශ්‍ය වේ. උෂ්ණත්වය මෙන්ම පින්න සහිත පරිසරය ද ඊට සුදුසු පසක් තිබීමද අත්‍යාවශ්‍යය සාධක වේ.

ලෝකයේ තේ වගාවේ ආරම්භය පිළිබඳව කරුණු සොයා බැලීමේදී තේ ගස නැගෙනහිර ඉන්දියාවේ , උතුරු තායිලන්තයේ හා දකුණු චීනයේ කඳුකර

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය kplmadhubhashini@gmail.com

කැළෑ ප්‍රදේශ වල ඉබේ හටගත් පැල විශේෂයකි. තේ කර්මාන්තය වේගවත්ව සංවර්ධනය වූයේ චීනයෙන් හා ජපානයෙනි. චීනයෙන් ජපානයට තේ ප්‍රචලිත වූයේ ක්‍රි. ව. 1000 දීය. මෙම රටවල තේ පාන උත්සව ආදී විවිධ සංස්කෘතික අංග තේ පානය ආශ්‍රිතව පවත්වා තිබේ. යුරෝපීය ජනයා විසින් චීනයේ තේ පඳුරු දැක ඔවුන්ගේ රටවලට ද රැගෙන ගොස් වගා කරනු ලැබූහ.

ලන්දේසි නැගෙනහිර ඉන්දියා සමාගම ක්‍රි. ව. 1602 දී තේ ආනයනය කරනු ලැබූවේ පෝලන්තයෙනි. එය ප්‍රථමයෙන් තේ අපනයනය කල යුරෝපීය දේශයයි. 17 වන සියවස මැද භාගය වන විට පෝලන්තය විසින් තේ පැළය එංගලන්තයට හඳුන්වා දෙනු ලැබීය. මින් වසර පනහකට පමණ පසුව තේ වගාවෙන් ලාභ ඉපයීමේ අරමුණින් බ්‍රිතාන්‍යන් විසින් සිය යටත් විජිත අධිරාජ්‍ය වූ ඉන්දියාවට හා ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දෙනු ලැබුවේය (සිල්වා, 2005).

ශ්‍රී ලංකාවට මුලින්ම තේ පැළය හඳුන්වා දුන්නේ ලන්දේසින් බවට මතයක් වෙතත් එහි සත්‍ය අසත්‍යතාවය වඩාත් පැහැදිලි නොවේ. 1839 දී මුල්වරට තේ පැළය මෙරටට හඳුන්වා දී තිබේ. පේරාදෙණිය උද්භිත උද්‍යානයේ අධ්‍යක්ෂකවරයෙක්ව සිටි එච්. ට්‍රීමන් 1886 වර්ෂයේ පරිපාලන වාර්තාවක මේ බව කරුණු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවට මුල් වරට 1839 දී ඇසෑම් වර්ගයේ තේ හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ ඉන්දියානු උද්භිත විද්‍යා විශේෂඥයකු වන ආචාර්ය වොලික්ටය. මුල් වරට ඇට තේ පේරාදෙණිය උද්භිත උද්‍යානයේ සිටවනු ලැබුවේය ( සිල්වා, 2005).

තේ වගාව හඳුන්වා දුන් මුල්ම යුගයේ සිටවූ බීජ තේ පැළවල ආර්ථික ආයු කාලය වසර 60-70 හෝ ඊට වැඩි කාලයක් බව කියැවේ. බීජ තේ වගාවෙන් රිකිලි තේ වගාවට යොමු වූ අතර රිකිලි තේ වගාවක ආර්ථික ආයු කාලය දිවයිනේ තේ වගා කරන විවිධ ප්‍රදේශ අනුව වසර 30-35 ක් වන බවට අනුමාන කෙරිණි. අද වුවද පහතරට කලාපයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතුවල වසර 30 කට ආසන්න ඵලදායී රිකිලි තේ වගාවන් පවතී (මහින්දපාල, 2012). භූමියේ පිහිටීම, දේශගුණික සාධක අනුව ප්‍රධාන තේ වගාවන් තුනකි. එනම් උඩරට තේ, මැදරට තේ, පහතරට තේ වශයෙනි.

එක් එක් අංශයන්ට සුවිශේෂ වූ යම් යම් ලක්ෂණ සැලකිල්ලට ගත්තද පහතරට ප්‍රදේශයේ කුඩා තේ වගාවක් වසර 20-25 ක් වත් පවත්වා ගත යුතු බවට අපේක්ෂා කල හැකිය. තත්වය එසේ වුවත් මෑත කාලීනව නැවත වගාවට යොමු කරන ලද සැලකිය යුතු කුඩා තේ ඉඩම් ප්‍රමාණයක් එසේ යොමුව ඇත්තේ සිටුවා වසර 12-14 ක් ගත වීමෙන් පසුව බව පෙනී ගොස් තිබේ. එනම් මෙම තේ වගාවල ආර්ථික ආයු කාලය 12-14 කට පමණ අඩු වී ඇත. පහතරට තේ වගාවේ වැඩිම අස්වනු දෙන කාල සීමාව වන්නේ වසර 9-12 ත් අතර කාලයයි. නමුත් දැන් සිදුවන ඛේදවාචකය නම් උපරිම අස්වැන්නක්

ලැබිය යුතු කාල සීමාවක තේ වගාව ගලවා නැවත වගා කිරීමට සිදු වීමයි. එනම් ආයු කාලය අඩු වීමයි. තේ පැළයක ආයු කාලය අඩු වීම සඳහා බලපාන හේතු සාධක රාශියකි (මහින්දපාල, 2012).

ලංකාවේ වගා කර ඇති බෝග වර්ගය අනුව වැඩිම වතු සංඛ්‍යාවක් වන 4909 ක් වගා කර ඇත්තේ පොල් ය. දෙවනුව තේ වගාව යටතේ වතු 2222 ක් ද , තෙවනුව රබර් වගාව යටතේ වතු 1990 ක් ද වගා කර ඇත. 2002 සංගණන වර්ෂය සමඟ සසඳන විට පොල් වතු සංඛ්‍යාව 767 කින්ද රබර් වතු සංඛ්‍යාව 659 කින්ද තේ වතු සංඛ්‍යාව 482 කින්ද වැඩි වී තිබේ. එසේ වුවද 2002 සංගණන වර්ෂය හා සැසඳීමේදී වගා කරන ලද බිම් ප්‍රමාණය අනුව (ක්‍රමවත් හා විසිරි වගාව යටතේ ) පොල් හා රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය වැඩි වී තිබුණද තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 293938 සිට 234124 දක්වා අක්කර 59814 කින් අඩු වී තිබේ. එම අඩුවීම ප්‍රතිශතයක් ලෙස 20.3% කි. ( ආර්ථික සංගණනය 2013/2014 )

තවද කලක් ශ්‍රී ලංකාව ලොව ප්‍රධානම තේ අපනයනකරු වීමේ ගෞරවයද 2016 වනවිට ලොව ප්‍රධානම අපනයනකරුවන් අතර සිව්වන ස්ථානය හිමි කර ගැනීමත් වැදගත් කරුණු වේ.

වගුව 01: ලෝකයේ ප්‍රධාන තේ අපනයන කරුවන්

| **රට** | **තේ නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් )** | **ලෝකයේ තේ අපනයනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|
| චීනය | 1924457 | 36% |
| ඉන්දියාව | 1208780 | 22.6% |
| කෙන්යාව | 432400 | 8% |
| ශ්‍රී ලංකාව | 340230 | 6.3% |

මූලාශ්‍රය: https://top5ofanything.com/list/d0fb35cf/Tea-producing countries-2016-06-22

දනට මුලු තේ නිෂ්පාදනයෙන් 72% ක් පමණ නිපදවන්නේ කුඩා තේ වතු ආශ්‍රිතව ලබා ගන්නා තේ දළු වලිනි. ඉතිරිය නිපදවන්නේ වතු සමාගම් වලින් පාලනය වන විශාල වතු වලිනි ( Ministri of plantation industries, 2013 ). බිම් සංවර්ධනයේ සිට පැළ සිටුවීම, නඩත්තුව, දළු නෙලීම සහ තේ දළු සැපයීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියකට කුඩා තේ වතු හිමියන් විශාල කාර්යය භාර්යයක් ඉටු කරයි. ඉහල යන කෘෂි රසායන මිල, යෙදවුම් මිල, අයහපත්

දේශගුණික සාධක ප්‍රධාන වශයෙන් මොවුන් මුහුණපාන ගැටලු වේ. ලබන ආදායම අඩු වීමෙන් ළමයින් සහ තරුණ පරම්පරාව කර්මාන්තයෙන් ඉවත් වී නගරයට සංක්‍රමණය වීම සිදු වෙයි. මෙය කම්කරු හිඟයට තදින්ම හේතු වී ඇත. තවද බොහෝ ගොවීන්ගේ තේ වගාව සම්බන්ධයෙන් විද්‍යානුකූල දැනුම ඉතා පහත් මට්ටමක මෙන්ම සාම්ප්‍රධායික මට්ටමක පවතී.

නමුත් ක්ෂණික මුදල් උපයන්නන් විසින් නීති විරෝධී ලෙස රසායන ද්‍රව්‍ය එකතු කිරීම, විනාශ කල යුතු, යල් පැන ගිය, මිනිස් පරිභෝජනයට නුසුදුසු තේ තොග වලින් බාල තේ නිපදවිම, හොර රහසේම අනියම් ක්‍රම ඔස්සේ විදේශයන්ට අපනයනය කිරීම මඟින් සිලෝන් තේ නාමයට විශාල කැළලක් සිදු වී ඇත (සමරවීර, 2011/05/13).

තේ කර්මාන්තය යනු ශ්‍රී ලංකාව තුල කතාබහට ලක්වන වැදගත් මාතෘකාවකි. වැවිලි කර්මාන්තය තුළ තේ කර්මාන්තය වැදගත් වනවා මෙන්ම වර්තමානය වන විට තේ කර්මාන්තය තුළද කුඩා තේ වතු අංශයේ දායකත්වය වැදගත් වෙයි. එම නිසා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ වැවිලි කර්මාන්ත අංශයේ දායකත්වය පුළුල් කිරීම සඳහා තව දුරටත් කුඩා තේ වතු අංශයේ දායකත්වය පුළුල් කිරීම වැදගත් වෙයි.

### ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය ගතහොත් ඉන් 61% ක් පහත් බිම් ආශ්‍රිතවත් 22% ක් උස් බිම් ආශ්‍රිතවත් 17% බිම් ආශ්‍රිතවත් නිපදවනු ලැබේ. මුළු තේ නිෂ්පාදනය අනුව 72% ක් කුඩා තේ වතු හිමියන්ද 28% ක් වතු හිමියන් විසින් ද නිෂ්පාදනය කරනු ලැබේ. ( Ministri of plantation industries, 2013 )


වගුව 02: ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය, භූමි ප්‍රමාණය හා නිෂ්පාදන පිරිවැය

| වර්ෂය | නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | නිෂ්පාදන පිරිවැය (RS/Kg) |
|---|---|---|---|
| 2005 | 317.2 | 211780 | 149.13 |
| 2006 | 310.8 | 215579 | 161.98 |
| 2007 | 304.6 | 210244 | 210.75 |
| 2008 | 318.6 | 211876 | 231.49 |
| 2009 | 291.1 | 208633 | 269.01 |
| 2010 | 331.4 | 204619 | 313.17 |
| 2011 | 327.5 | 206104 | 355.02 |
| 2012 | 328.4 | 203020 | 390.89 |
| 2013 | 340.0 | 202408 | 422.67 |

මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

තේ නිෂ්පාදන ප්‍රමාණය වසරෙන් වසර ඉහළ ගිය බවක් පෙන්නුම් කරන ලද අතර නිෂ්පාදන පිරිවැයද ක්‍රමක්‍රමයෙන් ඉහළ යන බවක් පෙන්නුම් කරයි. 2005 වර්ෂය වනවිට නිෂ්පාදන පිරිවැය 149.13 ක් වුව ද එය 2013 වන විට 422.67 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබේ. එමෙන්ම වගා කරන ලද භූමි ප්‍රමාණයද 2013 වන විට අඩු වීමක් දැක ගත හැකිය.

ප්‍රස්ථාරය 01: තේ නිෂ්පාදන ප්‍රමාණය හා පිරිවැය




මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

වසර 2005 සිට 2013 දක්වාම තේ නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් දක්නට නොලැබේ. එනම් සැලකිය හැකි වෙනස් වීමක් දක්නට නොලැබෙන අතර සුළු වෙනස් වීමක් පමණක් දැක ගත හැකි වේ. නමුත් තේ කිලෝවක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය සීඝ්‍ර ලෙස වැඩි වීමක් දැකගත හැකි වේ. 2005 දී රුපියල් 149.13 ක්ව පැවති තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය 2013 වන විට රුපියල් 422.67 ක් ලෙෂ සීඝ්‍ර වැඩි වීමක් දැක ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය අතීතයේ අපනයන අතින් විශාල ප්‍රමාණයක් හිමි කර ගත්තද වර්තමානය වන විට එසේ නොවේ. වර්තමානය වන විට විශාලතම අපනයන කර්මාන්තය වන්නේ ඇඟළුම් කර්මාන්තයයි. නමුත් රටේ දේශපාලනිකව වැදගත්ම අපනයන කර්මාන්තය වන්නේ තේ කර්මාන්තයයි. තේ කර්මාන්තයෙන් සෘජුව හා වක්‍රව ජීවිකාව සපයා ගන්නා ප්‍රමාණය නිමි ඇඳුම් කර්මාන්තයට වඩා වැඩිය. එපමණක්ද නොව ලංකාව වෙත බලපෑම් එල්ල කිරීමට  බටහිර රටවල් වලට නිමි ඇඳුම් කර්මාන්තයනැති කර දැමීමට හැකි වුවද තේ කර්මාන්තයට එම රටවලට බලපෑම් කල නොහැක. මේ නිසා


යම් හෙයකින් නිමි ඇඳුම් කර්මාන්තය බටහිර රටවල් විසින් විනාශ කරනු ලැබුවත් එයින් රැකියා අහිමි වන ජනගහනයට පිහිටට ඇත්තේ ද තේ ඇතුළු වෙනත් වැවිලි බෝග කර්මාන්තයයි. මේ නිසා තේ කර්මාන්තය රැකබලා ගැනීම ආර්ථික මෙන්ම දේශපාලන වැදගත් කමකින්ද යුක්තය. ලෝකයේ මිල වැඩිම තේ ලංකාවේ තේ වන නිසා බොහෝ රටවල් ලංකාවේ තේ භාවිතය අඩුකර මිල අඩු තේ පානය කිරීමේ ප්‍රවණතාවයක් පවතී ( චන්ද්‍රප්‍රේම, 2012/04/23).

වර්තමානය වන විට අපනයන අතින් තේ නිෂ්පාදනයෙන් හතර වන ස්ථානයේ සිටින ශ්‍රී ලංකාව 2004 වසරේදී තේ අපනයනය අතින් හිමි කර ගත්තේ දෙවන ස්ථානයයි. නමුත් කෙන්යාව, ඉන්දියාව, චීනය වැනි රටවල් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම, දියුණු තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, පර්යේෂණ සිදු කිරීම මගින් ප්‍රමිතියෙන් ඉහළ ප්‍රමාණාත්මකව වැඩි වශයෙන් තේ නිෂ්පාදනය කිරීමෙන් සාම්ප්‍රදායික ක්‍රම වලට හුරු වී සිටින අපේ කර්මාන්තයේ නියැලෙන්නන් දැඩි ව්‍යාකුල තත්වයකට පත් වී හමාරය. කෙසේ වුවද මේ තත්වයෙන් ගොඩ ඒම සඳහා විවිධ අංශ විවිධ ක්‍රියා මාර්ග ගනිමින් සිටී. විශේෂයෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මේ සඳහා විවිධ වැඩපිළිවෙළවල් දියත් කර තිබේ (සමරවීර, 2011/05/13).

**ශ්‍රී ලංකාවේ තේ අපනයනය**

තේ පැළ සිටුවීමේදී දැරීමට සිදු වී ඇති පිරිවැය අධික වීම, හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්නේ වැඩිවීමක් අපේක්ෂා කළ නොහැකි වීම, රුපියල අවප්‍රමාණය වීම යන කරුණු හේතුවෙන් ශ්‍රී ලංකාව ලොව විශාලතම තේ අපනයනකරුව සිට සිව්වන ස්ථානය දක්වා පසු බැසීමකට ලක් වී තිබේ.

ප්‍රස්ථාරය 02: ශ්‍රී ලංකාවේ තේ අපනයනය





මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

ශ්‍රී ලංකාවේ තේ අපනයනය 2000 වර්ෂයේ සිට දළ වශයෙන් සුළු වැඩි වීමක් දැකගත හැකි නමුත් එය යම් යම් උච්චාවචණයන්ට ලක් වී තිබේ. 2000 වර්ෂයේ අපනයනය කිලෝ ග්‍රෑෆම් මිලියන 281.4 කි. එය 2013 වර්ෂය වන විට කිලෝ ග්‍රෑෆම් මිලියන 306.0 ක් ලෙස වැඩි වී තිබුනද එය සැලකිය යුතු ප්‍රමාණයේ වැඩි වීමක් පෙන්නුම් නොකරයි. ඉහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් ද ඒ බව පැහැදිලි වේ.

**ශ්‍රී ලංකාවේ තේ මිල**

ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් සඳහා සාමාන්‍ය තේ දළු මිල 2013 වර්ෂය වන විට ඌව උස් බිම් ආශ්‍රිතව කි.ග්‍රෑ. එකක් රුපියල් 55.61 ක් ලෙසත්, බටහිර උස් බිම් ආශ්‍රිතව එය රුපියල් 61.41 ක් ලෙසත්, බටහිර මැදි බිම් වල රුපියල් 58.72 ක් ලෙසත් ඌව මැදි බිම් වල රුපියල් 60.44 ක් ලෙසත් පහත් බිම් ආශ්‍රිත තේ සඳහා රුපියල් 69.05 ක් ලෙසත් සඳහන් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ වැඩිම මිලක් හිමි වන්නේ පහතරට තේ සඳහාය ( Ministri of plantation industries, 2013 ).

ප්‍රස්ථාරය 03: ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් සඳහා තේ දළු මිල




මූලාශ්‍රය: Ministry of plantation industries (2013 )

කොළඹ තේ වෙන්දේසියෙහි 2002 වර්ෂයේ කිලෝ ග්‍රෑෆම් එකක් රුපියල් 150.28 කි. එය ක්‍රමක්‍රමයෙන් වැඩිවෙමින් 2013 වන විට රුපියල් 444.42 ක් දක්වා වැඩි වී තිබේ.

මෙම අධික මිලට හේතු වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම විශාල වතු වල අඩු නිෂ්පාදනයයි. කුඩා තේ වතු හිමියන් වතු වලට වඩා දෙගුණයකටත් වඩා අස්වැන්නක් ලබා ගනියි. වැඩි අස්වැන්නක් ලැබීම සඳහා වතු හිමියන් කල

යුත්තේ කුඩා තේ වතු හිමියන් අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙතයි. එනම් වැඩි අස්වැන්නක් ලබා දෙන වීපී තේ වගා කිරීම, නිසිකලට පොහොර දැමීම, පසෙහි ආම්ලික ගතිය පාලනය කිරිම පමණි. නිසි සාත්තුවක් නොකර තියෙන දෙය පමණක් පරිභෝජනය කිරීමේ මානසිකත්වය නිසා තේ නිෂ්පාදනයට වතු හිමියන් කරන්නේ අසාධාරණයකි. ඉහත දැක්වූ සුළු පියවර කිහිපය ගන්නේ නම් තේ කිලෝවක මිල සාධාරණමට්ටමකට පහළ වැටෙනු ඇත. එවැන්නක් නොකොට කෙටි කාලීන විසඳුමක් සොයමින් පිට රටින් ලාභ තේ ගෙන්වා මිශ්‍ර කොට අපනයනය කිරීමෙන් මුළු තේ කර්මාන්තයම විනාශ වීමට ඉඩ තිබේ. එමෙන්ම ලංකාවේ වෙළඳනාම පිටරට ප්‍රචලිත කිරීමයි. අපට වඩා නිෂ්පාදන වියදම අඩු රටවල් වලට වඩා අඩු මිලට ලංකාවෙන් තේ අපනයනය කල හැකියැයි සිතීම අතහැරදමා අඩු මිල මත නොව භාණ්ඩයේ ප්‍රමිතිය මත නව වෙළඳපොළවල් සොයා යෑම අනිවාර්යෙන් කල යුතු දෙයකි ( චන්ද්‍රප්‍රේම, 2012/04/23).

**සාරාංශය**

තේ කර්මාන්තය යනු ශ්‍රී ලංකාව තුල කතාබහට ලක්වන වැදගත් මාතෘකාවකි. වැවිලි කර්මාන්තය තුළ තේ කර්මාන්තය වැදගත් වනවා මෙන්ම වර්තමානය වන විට තේ කර්මාන්තය තුළද කුඩා තේ වතු අංශයේ දායකත්වය වැදගත් වෙයි. එම නිසා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ වැවිලි කර්මාන්ත අංශයේ දායකත්වය පුළුල් කිරීම සඳහා තව දුරටත් කුඩා තේ වතු අංශයේ දායකත්වය පුළුල් කිරීම වැදගත් වෙයි. දැනට මුලු තේ නිෂ්පාදනයෙන් 72% ක් පමණ නිපදවන්නේ කුඩා තේ වතු ආශ්‍රිතව ලබා ගන්නා තේ දළු වලිනි. ඉතිරිය නිපදවන්නේ වතු සමාගම් වලින් පාලනය වන විශාල වතු වලිනි. බිම් සංවර්ධනයේ සිට පැළ සිටුවීම, නඩත්තුව, දළු නෙලීම සහ තේ දළු සැපයීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියකට කුඩා තේ වතු හිමියන් විශාල කාර්යය භාර්යයක් ඉටු කරයි. ඉහල යන කෘෂි රසායන මිල, යෙදවුම් මිල, අයහපත් දේශගුණික සාධක ප්‍රධාන වශයෙන් මොවුන් මුහුණපාන ගැටලු වේ.  ලබන ආදායම අඩු වීමෙන් ළමයින් සහ තරුණ පරම්පරාව කර්මාන්තයෙන් ඉවත් වී නගරයට සංක්‍රමණය වීම සිදු වෙයි. මෙය කම්කරු හිඟයට තදින්ම හේතු වී ඇත. තේ නිෂ්පාදන ප්‍රමාණය වසරෙන් වසර ඉහළ ගිය බවක් පෙන්නුම් කලද නිෂ්පාදන පිරිවැය ක්‍රමක්‍රමයෙන් ඉහළ යන බවක් පෙන්නුම් කරයි. ලෝකයේ මිල වැඩිම තේ ලංකාවේ තේ වන නිසා බොහෝ රටවල් ලංකාවේ තේ භාවිතය අඩුකර මිල අඩු තේ පානය කිරීමේ ප්‍රවණතාවයක් පවතී. වර්තමානය වන විට අපනයන අතින් තේ නිෂ්පාදනයෙන් හතර වන ස්ථානයේ සිටින ශ්‍රී ලංකාව 2004 වසරේදී තේ අපනයනය අතින් හිමි කර ගත්තේ දෙවන ස්ථානයයි. මේ අනුව තේ පැළ සිටුවීමේදී දැරීමට සිදු වී ඇති පිරිවැය අධික විම, හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්නේ වැඩිවීමක් අපේක්ෂා කළ නොහැකි වීම, රුපියල අවප්‍රමාණය විම යන කරුණු හේතුවෙන් ශ්‍රී ලංකාව ලොව විශාලතම තේ අපනයනකරුව සිට සිව්වන ස්ථානය දක්වා පසු බැසීමකට ලක් වී තිබේ. මෙම

අධික මිලට හේතු වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම විශාල වතු වල අඩු නිෂ්පාදනයයි. අපට වඩා නිෂ්පාදන වියදම අඩු රටවල් වලට වඩා අඩු මිලට ලංකාවෙන් තේ අපනයනය කල හැකියැයි සිතීම අතහැරදමා අඩු මිල මත නොව භාණ්ඩයේ ප්‍රමිතිය මත නව වෙළඳපොළවල් සොයා යෑම අනිවාර්යෙන් කල යුතු දෙයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සිල්වා ආර්. (2005). *ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය.* රාජගිරියඃ කේ. එස්. යූ. ග්‍රැෆික්.

සේනානායක එස්. එම්. පී. (2008). *කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව.* මාලිගාවත්තඃ ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

චන්ද්‍රප්‍රේම. සී. ඒ (2012/04/23). *තේ කර්මන්තයේ අර්බුදයක්.* දිවයින.

සමරවීර. එම්. කේ. ( 2010/05/13). වළ පල්ලට යන තේ කර්මාන්තය. retrieved from E:\Tea indrusty thesis\TEA_files\වළ **පල්ලට යන තේ කර්මාන්තය**_php.mht

Ministri of plantation industries. (2015). statistical information on plantation crops 2013. Sri lanka: department of government printing.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. (2015). ආර්ථික සංගණනය 2013/2014. කොළඹඃ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

ලෝක ආර්ථික අර්බුදය හමුවේ අපේ විදේශ වෙළඳාම. Retrieved from http://www.divaina.com/2009/12/10/feature01.html 2016-10-10

ජයසුන්දර. ඩී වී. වී. තේ කර්මාන්තය විනාශ කිරීමට පිඹුරුපත් හදලා අවසානයි. දිවයින. Retrieved from http://www.divaina.com/2016/02/19/provin02.html

රත්නවීර. ටී. ලංකාවේ හීන වනසන තේ කෝප්පයේ කුණාටුව. Retrieved from http://www.divaina.com/2015/05/17/nimna07.html

තේ කර්මාන්තය අනතුරේ. Retrieved from http://vigasapuwath.blogspot.com/2016/10/blog-post_289.html